# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2045/51 – 2017 නොවැම්බර් 17 වැනි සිකුරාදා – 2017.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තනිප්පේරූ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 15බී, අත්තනගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අත්තනගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේ/එම්ඩබ්ලිව්එන්/2016/442 හා 2017.05.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අඹදෙනියවත්ත වැලිකන්ද කොටස (97 කොටස) – ප්‍රමාණය: හෙක්. 1.0211**

උතුරට: මාර්ගය සහ ප්‍රගමන අනුරේඛනය අංක කේ / එම්ඩබ්ලිව්එන් /2016/270 හි කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: අඹදෙණියවත්ත ඉතිරි කොටස; දකුණට: තුත්තිරිපිටියේහේන; බටහිරට: කැබලි අක්ෂර බී සහ අඹදෙණියවත්ත ඉතිරි කොටස.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0268**

උතුරට: අඹදෙණියවත්ත ඉතිරි කොටස සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: තුත්තිරිපිටියේහේන සහ කැබලි අක්ෂර සී; බටහිරට: කැබලි අක්ෂර සී, තුත්තිරිපිටියේහේන සහ ඇළ.

03. **කැබලි අක්ෂර 'සී' – අඹදෙනියවත්ත වැලිකන්ද කොටස (97 කොටස) – ප්‍රමාණය: හෙක්. 0.2146**

උතුරට: කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ තුත්තිරිපිටියේහේන; දකුණට: තුත්තිරිපිටියේහේන; බටහිරට: තුත්තිරිපිටියේහේන සහ ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2016/වීඊ/482.
2017 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 1462


1A – G 26616 – 10 (2017/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.